www.wsws.org
ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# අත්‍යසාමාන්‍ය ධනවත්කම: *ෆෝර්බ්ස්* සඟරාව වසරේ ඇමරිකානු ධනවතුන් 400 පෙලගස්වයි

**The filthy rich: *Forbes* lists America's top 400 for 2007**

**හිරාම් ලී විසිනි**
**2007 නොවැම්බර් 27**

*ෆෝර්බ්ස්* සඟරාව ධනවත්ම ඇමරිකානුවන් 400 දෙනාගේ ලැයිස්තුවක් ප්‍රකාශයට පත් කර තිබේ. පෙල ගැස්වීමේ 25 වන සංවත්සරය මින් සලකුනු කෙරේ. උද්ධමනයට ගැලපීමෙන් පසු අද ඩොලර් බිලියන 4.3ක් වන ඩැනියෙල් ලුඩ්විග් නම් නැව් හිමි ධන කුවේරයාගේ එවක (විසිපස් වසරකට පෙර) වටිනාකම බිලියන දෙකක් වූ අතර ඔහු ඇමරිකාවේ ධනවත් ම පුද්ගලයා විය. *ෆෝර්බ්ස්* හි වත්මන් 400 දෙනා හිමිකරගෙන ඇති සිත් සසලකරවන ධනයේ මට්ටම මගින් ඔහුගේ වාසනාව අඟුටුමිට්ට තත්වයට හෙලා තිබේ. අද දින ඇමරිකාවේ ධනවත්ම අය අතරට ලුඩ්විග්ගේ වාසනාවට හිමිවන්නේ යාන්තම් 80 වැනි තැනයි.

බිලියනයක වටිනාකමක් තිබීම *ෆෝර්බ්ස්* ලැයිස්තුවට ඇතුලත්වීමේ පූර්ව අවශ්‍යතාවක් බවට පත්වන්නේ ප්‍රථමවතාවට 2006 දී ය. යන්තම් වසරක් ගතවූ තැන එය තවදුරටත් සෑහෙන්නේ නැත. අද " ඇතුලත්වීමේ මිල" බිලියන 1.3කි. ලැයිස්තුවට ඇතුලත් පුද්ගලයන්ගේ ඒකාබද්ධ ශුද්ධ අගය දැන් ට්‍රිලියන 1.54ක් වීම අශෝභන මෙන් ම නින්දිතය. එය පසුගිය වසරට වඩා බිලියන 290කින් ඉහල යාමකි.

මයික්‍රොසොෆ්ට් හි බිල්ගේට්ස් යලිවතාවක් ලැයිස්තුවේ මුලට ම සිටින අතර, ඔහුගේ නමට ඇති වටිනාකම බිලියන 59ක් ලෙස ගනන් බලා තිබේ. ලැයිස්තුවේ දෙවැනියට සිටින බර්ක්ෂයර් හතවේ ආයෝජන ආයතනයේ නිර්මාතෘ වොරන් බියුෆට්ගේ වටිනාකම බිලියන 52 කි. ඔහුගේ ප්‍රකෝටිපති සගයන් බොහෝ දෙනෙකු විශ්මයට පත් කරවමින්, 400 ලැයිස්තුවේ සිටින තමන් හා සිය සගයන් "අපගේ සනීපාරක්ෂක කාන්තවන් හෝ අපගේ පිලිගැනීමේ නිලධාරින්ට වඩා අප ආදායම් බදු ගෙවන්නේ අඩු ප්‍රතිශතයකින්" බව පෙන්වා දීමෙන්, මෑතක දී ආන්දෝලනයක් ඇතිකලේ මෙම බියුෆට් ය.

*ෆෝර්බ්ස්* ලැයිස්තුවේ ඉහලින් ම සිටින 10 දෙනාට ඇතුලත්වන අනෙකුත් අය අතර සිටින ලාස්වේගාස් හි නිවාඩු නිකේතන හා කැසිනෝ අයිති ධනකුවේර ෂෙල්ඩන් ඇඩෙල්සන් හා කර්ක් කර්කොරියන් පිලිවෙලින් බිලියන 28කට හා 18කට හිමිකම් කියති. ගූගල්හි සර්ගේ බ්‍රින් හා ලැරී පේජ් බිලියන 18.5 බැගින් හිමිකර ගනිති. මෑතක දී අභ්‍යන්තර ගනුදෙනු හුටපටයකට පැටලුනු ඔරකල්හි ප්‍රධාන විධායක ලැරී එලිසන් බිලියන 26ක් ද, ඩෙල් පරිඝනක සමාගමේ ප්‍රධාන විධායක මයිකල් ඩෙල් බිලියන 17.2ක් ද හිමිකරගනිති. ඩෙල්, බුෂ්ගේ විද්‍යා හා තාක්ෂනික උපදේශක කවුන්සිලයේ ද සේවය කරයි. ඔහු මෙම අරුම පුදුම ආදායම් උපයා ඇත්තේ රැකියා 8000ක් අතුගා දැමූ (ඔහුගේ ශ්‍රම බලකායෙන් සියයට දහයක්) එම වසර තුලම ය.

දක්ෂිනාංශික කැටෝ ආයතනයේ නිර්මාතෘ චාර්ල්ස් කොච් හා ඔහුගේ සොහොයුරා වන ඩේවිඩ්, පිලිවෙලින් බිලියන 17 බැගින් හිමිකරගෙන මුදුනේ ම වන 10 අතරට ඇතුල් වෙති. ඔවුන් අන්තගාමී හා ප්‍රති කොමියුනිස්ට්වාදී ෆ්‍රෙඩ් කොච් හි උරුමක්කාරයින් ද කොච් කාර්මික තෙල් සමාගමේ ප්‍රධාන ප්‍රතිලාභීන් ද වෙති. කොච් කර්මාන්තය, රටේ විශාලතම පෞද්ගලික සමාගම වන අතර, පරිසර දූෂනය පිලිබඳව නම් දරා සිටියි. ටෙක්සාස්හි එහි එක් පිරිපහදුවක්, අන්තරායකාරී අපද්‍රව්‍ය හා වායු දූෂනය පිලිබඳ නීති උල්ලංඝනය කිරීම ද ඇතුලත්ව මවු සමාගම 2000 වසරේ දී පරිසර දූෂන අපරාධ 97 කට චෝදනා ලැබ සිටියහ. 2001 දී බුෂ් පරිපාලනය වොෂින්ටනයේ දී බලයට පත්වීමෙන් පසුව බොහෝ චෝදනා ඉවත ලූ අතර සමාගම ඉතා පහසු මිලියන 20ක වන්දියක් ගෙවීමේ එකඟතාවක් සහිත අභියාචන තීන්දුවක් ඇති කර ගන්නා ලදී.

ධනවත්ම අය වියහැකි වුවත් නිසැකව ම කොච් සහෝදරයන් ප්‍රකෝටිපති තෙල් සමාගම් කාර ශ්‍රේනියේ එකම සමූහය නො වේ. මෙම වසරේ ලැයිස්තුවෙහි වාසනාවන්තයන් 30 දෙනෙකුට නොඅඩු ගනනක ගේ ධන උල්පත තෙල් හා ගෑස් බව *ෆෝර්බ්ස්* සඳහන් කරයි. මිලියන 300ක ඇමරිකානුවන්ගේ බලශක්ති හා සම්පත් අවශ්‍යතාවන්, අතලොස්සක් වන මෙම 30 දෙනාගේ ලාභ අරමුනුවලට යටත් ය. එය පලදරන කර්මාන්තයක් බව තහවුරු වී තිබේ. කම්කරු පන්තික පවුල් මත දැවැන්ත පීඩනයක් යොදා ඇති ඉහල ඉන්ධන මිලගනන්වලට හේතු කාරක වූ පිරිපහදු වසා දැමීමේ

උපාය වැනි වෙළඳපොල මගඩිවලට පින්සිදු වන්නට තෙල් කර්මාන්තය මෑත වසරවල වාර්තාගත ලාභ උපයා තිබේ.

මෑත ෆෝර්බ්ස් ලැයිස්තුගත කිරීම්වල ඇති තවත් ප්‍රවනතාවක් නම්, පුද්ගලයන් විශාල ගනනක් තම ධනය උපයා ඇත්තේ නිෂ්පාදන අංශයෙන් පිටතදී වීමයි. "නිෂ්පාදන" හෝ "කැනීම් කටයුතු" ධන ඉපැයුම් මූලාශ්‍ර ලෙස ලැයිස්තුගතව ඇත්තේ අවස්ථා කිහිපයකදී පමනි. ඒ වෙනුවට අපට දැකිය හැක්කේ "දේපල" " උරුමය" "රක්ෂිත අරමුදල්" හා "ව්‍යාපාර වස්තු මිලට ගැනීම්" ෆෝර්බ්ස් 400 බොහෝ දෙනෙකුගේ ධන මූලාශ්‍රය ලෙස ප්‍රකාශිතව ඇති බවය.

රිපබ්ලිකන් පක්ෂයට සමීප බැඳීම් ඇති හෙන්රි ක්‍රේවිස් එවැනි මාර්ගයකින් සිය වාසනාව සලසා ගත් එක් අයෙකි. ඔහු 1992 ජොෂ්ට බුෂ් යලි ජනාධිපති වීමේ මැතිවරන ව්‍යාපාරයට සම්බන්ධව සිටි අයෙකි. ඔහුගේ නොඇදහිය හැකි තරම් ලාභ දායක " ව්‍යාපාරවස්තු මිලට ගැනීම්" සාකච්ඡා කරන ෆෝර්බ්ස් , ක්‍රේවිස්ගේ "ජයග්‍රාහී මූලෝපාය" නමැති සූත්‍රය විස්තර කරන්නේ මෙලෙස ය. "අකාර්යක්ෂම සමාගම් මිලට ගැනීමට තුට්ටුදෙකේ නයකරයන් යොදාගන්න, ශේෂපත්‍ර යලි සකසන්න, ලාභ ඇතිව විකුනන්න." නූතන ව්‍යවසායකයාට තුන් පනතක් වැනි වූ මෙම සූත්‍රය, අතලොස්සකට තෙරක් නැති ධනය ද බහුතරයකට දිලිඳුකම ද ලඟා කර දෙයි. එවන් " ව්‍යාපාරවස්තු මිලට ගැනුම්"වලට සම්බන්ධ " යලිසැකසුම්" හා ප්‍රතිව්‍යුහගතකිරීම් කම්කරු පන්තියේ ජීවන තත්වයන්ට නිමක් නැති ප්‍රහාරයන් හා රැකියා විනාශය ලඟා කර දෙයි.

සුපිරි ධනවතුන්ගේ අතිශයින්ම සුවිශේෂී වූ සමාජ ශාලාව වෙත මෙම පරපුටු වර්ගයේ බොහෝ දෙනෙකු තම මාවත සොයාගැනීම, ඇමරිකානු ධනවාදයේ අර්බුද ග්‍රස්ත ස්වභාවය හා දිරාපත්වීමට පිදෙන බලගතු අන්තිම කැමති පත්‍රයක් වැනි ය. විශේෂයෙන් ම පරපුටු උපාමාරු දැමීමෙන් කඩාවඩාගන්නා වූ ඉක්මන් හා සීමාන්තික ධන රාශිකරනය, තනිකර ම ඇමරිකානු ප්‍රභූ පැලැන්තියට අවධානය යොමු කරන ෆෝබ්ස් වර්ගීකරනයට වෙනස් ලෙස, ජාත්‍යන්තර සංසිද්ධියකි.

ෆෝචූන් සඟරාවට අනුව ලෝකයේ ධනවත් ම මිනිසා යන තානාන්තරය දැනට දරා සිටින්නේ මෙක්සිකෝවේ කාලෝස් ස්ලිම් හෙලු නැමැත්තා ය. ඔහු ඒ සඳහා යන්තමින් බිල්ගේට්ස් පරාජය කරයි. තම පුත්‍රයාගේ ව්‍යාපාරික ක්‍රියාදාමයේ ආකෘතිය ලෙස කටයුතු කල සලිම්ගේ පියා වන ජුලියස් ස්ලිම්, ඔහුගේ ධනය උපයා ගත්තේ 1910, විප්ලවය අවධියේ දී, මෙක්සිකෝ නගරයේ හදවත බඳු කොටසේ දේපල බොහෝ ප්‍රමානයක් මිලට ගැනීමෙන් පසු, දේපල ගනුදෙනුවලිනි. මුලින් රජය සතු දුරකථන සමාගමක් වූ ටෙලිෆොනොස් ඩි මෙක්සිකෝ අත් කර ගැනීමෙන් පසුව ස්ලිම් තමාගේ ම ඉසුරුමත් භාවය සරි කර ගත්තේ ය. එම සමාගමේ ඒකාධිකාරය දැන් රැඳී ඇත්තේ ස්ලිම් අත ය. ඔහු රටේ දුරකථන මාර්ග වලින් සියයට 92ක් ම පාලනය කරයි.

ස්ලිම් ඉසුරුමත් බව විස්තර කරමින් *ෆිනෑන්ෂල් ටයිම්ස්* හි මෑත පලවූ ලිපියක මාටින් වුල්ෆ් ලියා ඇත්තේ ස්ලිම් පවුලේ ආදායම "මෙක්සිකෝවේ දුප්පත්ම මිනිසුන් මිලියන තුනකගේ දැන් ආදායමට සමාන" බවයි. ස්ලිම්ගේ ධනය "මෙක්සිකෝවේ දල දේශීය නිෂ්පාදිතයෙන් සියයට 6.6 කට සමාන" ය.

ඉන්දියාවේ සුපිරි ධනවතුන් මුලුමනින් ම පාහේ සැදුම්ලන්නේ ප්‍රකෝටිපතියන් ගෙන් යයි ෆෝබ්ස් ලැයිස්තුව ප්‍රථම වතාවට මෙම වසරේ සලකුනු කරයි. ඉන්දියානු වර්ගීකරනයේ ප්‍රකෝටිපතියන් 40 දෙනාගේ ඒකාබද්ධ ධනය ඩොලර් බිලියන 351කි. එය පෙර වසරේ ඩොලර් බිලියන 170ක් පමනි. ඇමරිකානු ලැයිස්තුවේ එවන් ඉහලකට නැගුනු ප්‍රභූ පැලැන්තිය සේම එම වර්ගයේ සමපේක්ෂනාත්මක, නිෂ්පාදන නොවන ව්‍යවසායන්ට පින්සිදුවන්නට චීනයේ ද, ප්‍රකෝටිපතියන්ගේ තියනු හා හදිසි නැගීමක් දක්නට ඇත. *ලෝක සමාජවාදී වෙබ් අඩවිය* නොවැම්බර් 14 ලිපියකින් වාර්තා කල පරිදි "2002 දී චීනයේ ප්‍රකෝටිපතියන් කිසිවෙකුත් නොසිටි අතර පසු ගිය වසරේ දී 15ක් සිටියේ ය. දැන් චීනය, ඇමරිකාවට පසුව විශාලතම ප්‍රකෝටිපතියන් කන්ඩායමක් සිටින රට ය. ඇමරිකාවේ ප්‍රකෝටිපතියන් 410 දෙනෙකි. මුලින් දෙවැනි තැන දැරූ ප්‍රකෝටිපතියන් 55ක් සිටි ජර්මනිය මෙන් දෙගුනයකට ආසන්න සංඛ්‍යාවක් දැන් චීනයේ සිටිති."

ෆෝබ්ස්හි ප්‍රකෝටිපතියන් 400 හා ලෝකය පුරා සිටින අනෙකුත් කතිපයාධිකාරීන් සිය ධනය පොදි ගසා ගන්නා පරිද්දෙන්, කනස්සල්ල දනවන එම සංඛ්‍යාලේඛනවලින් ම තවත් කථාන්තරයක් ද දිග හැරෙමින් තිබේ.

එක්සත් ජනපද සංඛ්‍යාලේඛන බියුරෝවේ මෑත දත්ත පෙන්නුම් කරන්නේ 2006 වසරේ දී, මිලියන 12.8ක් ලමුන් ද ඇතුලත්ව, එරට තුල මිලියන 36.5ක් ජනතාව ජීවත් වන්නේ දිලින්දන් ලෙස බව ය. මෙම සංඛ්‍යාව, තිදෙනෙකුගෙන් යුත් පවුලකට ඩොලර් 16079ක් යන තරයේ ම නොපෑහෙන්නා වූ දිලිඳුකමේ එලිපත්තක් මත පදනම් ව ඇත. මෙම කනස්සල්ල දනවන්නේ වී නමුත් දිලිඳුකමේ ගිලී ඇති ජනතාව පිලිබඳ සැබෑ සංඛ්‍යාව නිසැකව තරයේ අවතක්සේරු කර තිබේ.

නිවාස වෙලඳපොලෙහි දිගට ම පවත්නා අර්බුදය වාර්තාගත වෙන්දේසි කිරීම්වලට තුඩු දී තිබේ.

ඒ, එකතැන පල්වෙන හෝ පිරිහෙන වැටුල් හා ඉහල නිවාස මිල ගනන්වල සන්දර්භය තුල, ඉහල අවදානමක් ඇති අඩු වරප්‍රසාදිත උකස්කරයන් ගැනීමට බල කෙරී තිබෙන කම්කරු පන්තික පවුල් දඩයම් කරන කොල්ලකාරී අඩුවරප්‍රසාදිත නය දෙන්නන්ට විශාල වසයෙන් පින් සිදු වන්නටය. එක්සත් ජනපද කොන්ග්‍රසයේ ඒකාබද්ධ ආර්ථික කමිටුව ඔක්තෝබරයේ නිකුත් කල වාර්තාවක මෙසේ සඳහන් වේ. "2007 ප්‍රථම කාර්තුවෙන් පටන් ගෙන 2009 අවසාන කාර්තුව තෙක් වන කාලය තුල නිවාස මිල ගනන් පහත වැටෙමින් තිබුනොත්, අඩු වරප්‍රසාදිත වෙන්දේසි කිරීම් පමනක් දල වශයෙන් මිලියන 2ක් වන බවට අපි තක්සේරු කරන්නෙමු."

සිවිල් ඉංජිනේරුවන්ගේ ඇමරිකානු සමාජය (ඒඑස්සීඊ) එක්සත් ජනපදයේ යටිතල ව්‍යහය පිලිබඳ සිය 2005 වාර්තාවෙන් කියා සිටියේ මුලු රටේ ම යටිතල ව්‍යුහය ලබා ගන්නේ "ඖ" සලකුනක් බවයි " රටේ 590,750 ක් වන පාලම්වල අබලන්තාවය මග හැරීමට නම් වසර 20ක් සඳහා වසරකට ඩොලර් බිලියන 9.4 බැගින් අවශ්‍ය වේ." යටිතල ව්‍යුහය සඳහා අවශ්‍ය වන සමස්ත ආයෝජනය ඩොලර් ට්‍රිලියන 1.6ක් ලෙසට ගනන් බලා ඇත.

එක්සත් ජාතීන්ගේ සංවර්ධන සැලැස්ම විසින් ප්‍රකාශිත 2006 වසර සඳහා වූ මානව සංවර්ධන වාර්තාව කියා සිටින්නේ "21 වැනි සියවස ආරම්භයේ දී බිලියන 1.1 වන සංවර්ධනය වෙමින් පවතින ලෝකයේ සෑම මිනිසුන් 5 දෙනෙකුගෙන් එක් අයෙකු ට පිරිසිදු ජල පහසුකම් නොලැබේ. එ රටවල සමස්ත ජනගහනයෙන් හරි අඩක් පමන වන බිලියන 2.6ක් ජනතාවට සරිලන වැසිකිලි පහසුකම් නැත."

ජාත්‍යන්තර ආහාර ප්‍රතිපත්ති පර්යේෂන ආයතනයේ "2007 වසරේ සාගින්නේ අභියෝග" යන සිරස්තලය සහිත වාර්තාවේ ආරම්භක වැකි තුල මෙවන් බිහිසුනු සංඛ්‍යා ලේඛන අපට කියවන්නට ලැබේ. "සෑම මිනිසුන් 7 දෙනෙකුගෙන් එක් අයෙක් නින්දට යන්නේ කුසගින්නේ ය. ඒ මුලු ලෝකයේ ම මිලියන 854ක ජනතාවකි." මීට අමතරව ධනවත්ම ඇමරිකානුවන් ලේඛන ගත කිරීම් 25 වැනි සංවත්සරය දැනුම් දෙන ෆෝබ්ස් සඟරාවට ම. ලෝක ජනගහනයෙන් එක් බිලියනක් ජීවත් වන්නේ දිනකට එක් ඩොලරයකට වඩා අඩු ආදායමක් සහිතව බව වාර්තා කිරීමට සිදුව තිබේ.

එන්ට එන්ටම සාපරාධී වන්නා වූ ප්‍රභූ පැලැන්තියක් විසින් සූරා කනු ලබන ලෝක ජනගහනයෙන් බහුතරයක් සහිත ධනේශ්වර පද්ධතියක ශාප ලත් චිත්‍රයක් මෙම වාර්තා මගින් ද, ෆෝබ්ස් හි 400 මගින් ද අප වෙත සම්පාදනය කෙරේ. වඩවඩාත් ධනය අනතුරු දායක වේගයකින් ද එසේ ම කොල්ලකාරී ක්‍රමවලින් ද අල්පතරයක් අත සංකේන්ද්‍රනය වීමත් සමග, ලෝකය පුරා දුගී හා වැඩ කරන ජනතාවගේ ජීවන තත්වයන් තව තවත් පතුලට ඇද දැමෙයි. මෙවන් පද්ධතියක අවසන් විනාශය නොවැලැක්විය හැකිවාක් මෙන් ම අවශ්‍ය ද කෙරේ.

© www.wsws.org